ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
இலங்கை சமூகப் பாதுகாப்புச் சபை
Sri Lanka Social Security Board
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில் மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය/ எனது இல : 4/2/3/චක්‍රලේඛ
ඔබේ අංකය/ உமது இல :

දිනය / திகதி / Date : 2021-01-15

*__චක්‍රලේඛ අංක. : SLSSB 1/2021__*

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

## විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - දිරිදීමනා ගෙවීම

ඉහත කරුණ පිළිබඳව ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් නිකුත් කළ 1/2013 සහ 1/2020 දරණ චක්‍රලේඛ වෙත අවධානය යොමුකරමි.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට සාමාජිකයන් බඳවාගැනීම සහ වාරික රැස්කිරීම වෙනුවෙන් සම්බන්ධවන නිලධාරීන් වෙනුවෙන් දිරිදීමනා ගෙවීමට අදාළව ඉහත සඳහන් චක්‍රලේඛ නිකුත් කර ඇත. නව සාමාජිකයන් බඳවාගැනීම වෙනුවෙන් වෙන්කර ඇති දීමනා ප්‍රතිශතය අයකරනු ලබන මුල් වාරික මුදලින් 15% ක් වූ අතර, එම ප්‍රතිශතය 20% දක්වා වැඩිකිරීමට අ.ම. 2020/260/23 දරණ පත්‍රිකාව මගින් 2021.01.04 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2021.01.01 දින සිට පහත සඳහන් පරිදි දිරිදීමනා ගෙවීම කරනු ලබන බව සඳහන් කරමි.

වගුව අංක. 1 : දායකයින් බඳවාගැනීමේදී දිරිදීමනා ගෙවීම

(බඳවාගනු ලබන පළමු වාරික මුදල රැස්කිරීම මත පමණක් මෙම දිරිදීමනාව හිමිවේ.)

| අනු අංකය | සම්බන්ධ වන නිලධාරී | දිරිදීමනා ප්‍රතිශතය % |
|---|---|---|
| 01 | දිස්ත්‍රික් ලේකම් | 0.50% |
| 02 | ප්‍රාදේශීය ලේකම් | 0.75% |
| 03 | සහකාර ප්‍රාදේශීය ලේකම් | 0.30% |
| 04 | ගණකාධිකාරී | 0.20% |
| 05 | පරිපාලන ග්‍රාම නිලධාරී | 0.20% |
| 06 | සමාජ සේවා නිලධාරී | 0.70% |
| 07 | බඳවාගන්නා නිලධාරී<br>I. ග්‍රාම නිලධාරී<br>II. සමෘද්ධි සංවර්ධන නිලධාරී<br>III. ආර්ථික සංවර්ධන නිලධාරී/සංවර්ධන නිලධාරී<br>IV. ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරන වෙනත් නිලධාරී | 20.00% |
| 08 | කළමනාකරණ සහකාර | 0.70% |
| 09 | මුදල් අයකැමි | 0.15% |
| | **එකතුව** | **23.50%** |

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ ඒ විෂයයන් වෙනත් නිලධාරියෙකු වෙත පවරා ඇත්නම් ඉහත දිරිදීමනා ප්‍රමාණය අදාළ නිලධාරීන් වෙත ගෙවීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත හිමිවේ.



පොදු දුරකතන / பொது தொலைபேசி இல. / General No. : 0112 886585 / 0112 886586
ක්ෂණික ඇමතුම් / உடனடி அழைப்பு / Hot Line : 0112 886088
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.ssb.gov.lk ඊ-මේල් / ஈ-மெயில் / E-mail : info@ssb.gov.lk
"සමාජ ආරක්ෂණ පියස", අංක 18 , රාජගිරිය පාර, රාජගිරිය "Samaja Arakshana Piyasa" ,No.18, Rajagiriya Road, Rajagiriya "சமாஜ ஆரக்ஸன பியச", இல.18, ராஜகிரிய வீதி, ராஜகிரிய

වගුව අංක 2 : වාරික රැස්කිරීම වෙනුවෙන් දිරිදීමනා ගෙවීම

(වාරික රැස්කිරීම වෙනුවෙන් වසර 05 ක් දක්වා පමණක් මෙම දිරිදීමනා ගෙවනු ලැබේ.)

| අනු අංකය | අදාළ නිලධාරි | දිරිදීමනා ප්‍රතිශතය % |
|---|---|---|
| 01 | දිස්ත්‍රික් ලේකම් | 0.20% |
| 02 | ප්‍රාදේශීය ලේකම් | 0.30% |
| 03 | සහකාර ප්‍රාදේශීය ලේකම් | 0.11% |
| 04 | ගණකාධිකාරි | 0.08% |
| 05 | පරිපාලන ග්‍රාම නිලධාරි | 0.17% |
| 06 | සමාජ සේවා නිලධාරි | 0.17% |
| 07 | වාරික රැස්කිරීම් නිලධාරි<br>I. ග්‍රාම නිලධාරි<br>II. සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>III. ආර්ථික සංවර්ධන නිලධාරි/සංවර්ධන නිලධාරි<br>IV. ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරන වෙනත් නිලධාරි | 3.60% |
| 08 | කළමනාකරණ සහකාර | 0.19% |
| 09 | මුදල් අයකැමි | 0.08% |
| | එකතුව | **4.90%** |

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ ඒ විෂයයන් සඳහා වෙනත් නිලධාරීන් පත්කර ඇත්නම් අදාළ දිරිදීමනාව එම නිලධාරියාට ගෙවීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත හිමිවේ.

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඔබගෙන් ලැබෙන නිරන්තර සහය හා මැදිහත්වීම අගය කරමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳරාගම
B.A. (Special) Sociology (Hons) (CMB), MA in Sociology (CMB), CTHE (CMB).
සභාපති
දුරකථන අංක - 071-4403877/0777-303934 / saman@ssl.sab.ac.lk / chairman@ssb.gov.lk

පිටපත්:
1. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.
2. ලේකම්, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය.
3. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.
4. සියලුම ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන් හා සම්බන්ධීකරණ නිලධාරීන්.

} කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා.